" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා අප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**

**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mqwatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary — දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599; ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601; ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone — 011 - 2093000

ISO 9001

ISO/IEC: 17021
QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. — CSWP/FIN-AP/03/FI/01

ඔබේ අංකය / உமது இலக்கம் / Your No. —

දිනය / திகதி / Date — 2021.10.18

(9)

# මූල්‍ය චක්‍රලේඛ 08/2021

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
ව්‍යවස්ථාපිත අධිකාරිවල සභාපතිවරු (බ.ප.).

## ප්‍රජා පාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් පැවරීමේ ක්‍රමය.

භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද 2021.09.29 දිනැති **"ප්‍රජා පාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් පැවරීමේ ක්‍රමය"** යන මැයෙන් යුතු රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2021 හි පිටපතක් මේ සමඟ අමුණා ඇත.

02. ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2021.10.06 දිනැති ලිපිය මඟින් ඉහත සඳහන් චක්‍රලේඛය බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දැනුම් දී ඇත. එහෙයින් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් හා පළාත්
භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත: 01.විගණකාධිපති
02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
03.තොරතුරු තාක්ෂණ නිලධාරී.



| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதான செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මුදල / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதான உள்ளகக் கணக்காய்வாளர் / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel : 0112092606<br>Fax : 0112092609<br>dcsadmin@cs.wpc.gov.lk | Tel : 0112092631<br>Fax : 0112092647<br>dcspt@cs.wpc.gov.lk | Tel : 0112092640<br>Fax : 0112092636<br>dcsfinance@cs.wpc.gov.lk | Tel : 0112092532<br>Fax : 0112092533<br>dsplan@cs.wpc.gov.lk | Tel : 0112092501<br>Fax : 0112092505<br>dcs@eng.wpc.gov.lk | Tel : 0112092628<br>Fax : 0112092625<br>cia@cs.wpc.gov.lk |

මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: (94)-011-2484500, (94)-011-2484600, (94)-011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: (94)-011-2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No | PFD/PMD/Cir/2021/01 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2021.09.29 |

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2021

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ දිස්ත්‍රික් ලේකම්වරුන්,
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, අධිකාරී සහ
රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත

<u>ප්‍රජා පාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් පැවරීමේ ක්‍රමය</u>

ප්‍රසම්පාදනයේ දී ප්‍රජා සහභාගීත්වය පිළිබඳව මාර්ගෝපදේශ නිකුත් කර ඇති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 හි 3.9 වගන්තිය හා ප්‍රසම්පාදන අතිරේක 3.9.1 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමි.

2. ඒ අනුව, 2021.09.29 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රජා පාදක සංවිධානවලට සෘජු කොන්ත්‍රාත් පැවරීමේ දී බලපැවැත්වෙන කොන්දේසි සහ අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත පහත දැක්වේ.

2.1 දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයින් දෙදෙනකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් මගින් මෙහි අංක 2.3 යටතේ සඳහන් කර ඇති සුදුසුකම් පරීක්ෂා කර සනාථ කිරීමෙන් අනතුරුව පහත සඳහන් ප්‍රජා පාදක සංවිධාන වෙත ඉදිකිරීම් වැඩ කොන්ත්‍රාත් පැවරිය හැකි ය.

i. සමෘද්ධි ප්‍රජා මූල සංවිධාන/සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන
ii. විවිධ සේවා සමුපකාර සමිති
iii. සමුපකාර කම්කරු සමිති (කම්කරු සේවා සඳහා පමණක්)
iv. ග්‍රාම සංවර්ධන සමිති
v. පාසැල් සංවර්ධන සමිති (බල සීමා ප්‍රදේශයට අදාළව පාසැල් පරිශ්‍රයන්හි ක්‍රියාත්මක)
vi. ලියාපදිංචි ගොවි සංවිධාන

vii. ප්‍රජා සංවර්ධන සමිති (පළාත් පාලන ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතුවලට දායක වන්නා වූ පළාත් පාලන කොමසාරිස්වරුන් යටතේ ලියාපදිංචි සමිති)

viii. ගැමි දිරිය මහජන සමාගම්

ix. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය යටතේ ලියාපදිංචි කරන ලද සහාධිපත්‍ය කළමනාකරණ සංස්ථා

x. විහාරස්ථ කාර්ය සාධන සමිති (ස්වකීය විහාරස්ථාන හා දහම් පාසල් පරිශ්‍රයන්හි ක්‍රියාත්මක)

xi. විහාරස්ථ දායක සභා (ස්වකීය විහාරස්ථාන හා දහම් පාසැල් පරිශ්‍රයන්හි ක්‍රියාත්මක)

xii. සමාජ සේවා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලයේ ලියාපදිංචි ග්‍රාමීය වැඩිහිටි කමිටු/ සමිති

xiii. ප්‍රාදේශීය ලේකම්වරයාට සෑහීමකට පත් විය හැකි එකී ප්‍රාදේශීය ලේකම් යටතේ ලියාපදිංචි වී ඇති සමිති සහ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් හඳුනාගන්නා ප්‍රජා සංවිධාන

2.2 මෙම ක්‍රමය යටතේ, දැනටමත් පිරිනමා ඇති කොන්ත්‍රාත්තුවල ඉතිරි කොටසේ මුළු වටිනාකම සහ යෝජිත කොන්ත්‍රාත්තුවේ වටිනාකමෙහි එකතුව රුපියල් මිලියන 5ක් නොඉක්මවිය යුතු ය.

2.3 මෙම ප්‍රජා පාදක සංවිධාන පිළිබඳ ඉහත 2.1 හි සඳහන් කමිටුව විසින් පහත සඳහන් ලිපි ලේඛන පරීක්ෂා කර යෝග්‍යතාව සමාලෝචනය කිරීමෙන් අනතුරුව සුදුසු ප්‍රජා පාදක සංවිධානවලට වැඩ කොන්ත්‍රාත් පැවරීම නිර්දේශ කළ හැකි ය.

i. සමෘද්ධි බැංකු, සමුපකාර බැංකු හෝ ග්‍රාමීය බැංකු වැනි මූල්‍ය ආයතන විසින් බැංකු ගිණුම් සහ මූල්‍ය පහසුකම් ඇති බව සනාථ කරන ලිපි ලේඛන

ii. සමාන වැඩ පිළිබඳ පෙර පළපුරුදුකම්වලට දායක වී ඇති බවට අදාළ සහතික හෝ ඉටු කර ඇති වැඩ පිළිබඳ මෙන්ම ඒවායේ ප්‍රමිතීන් පිළිබඳ සෑහීමකට පත් විය හැකි සාක්ෂි

iii. අවුරුද්දකට පෙර පිරිනමන ලද නමුත් අසම්පූර්ණ කොන්ත්‍රාත් ද ඇතුළුව ඉකුත් වසර තුළ ඔවුනට පිරිනමන ලද කොන්ත්‍රාත් වැඩ පිළිබඳ අදාළ සමිතිය නිකුත් කර ඇති ප්‍රකාශයන් (කොන්ත්‍රාත් නාමය, ස්ථානය, සේවාදායක, කොන්ත්‍රාත්තුවේ වටිනාකම සහ වර්තමාන තත්ත්වය)

iv. අදාළ කාර්යය උප කොන්ත්‍රාත් නොදෙන බවට අදාළ සමිතිය නිකුත් කළ ප්‍රකාශයක් (උප කොන්ත්‍රාත්වල යෙදුනහොත් එවැනි සමිති/සංවිධාන අසාධු ලේඛන ගත කළ යුතු ය.)

2.4 කොන්ත්‍රාත්තුව පිරිනමන අවස්ථාවේදී අදාළ ප්‍රජා පාදක සංවිධානය කොන්ත්‍රාත් තුනකට වඩා වැඩි කොන්ත්‍රාත් ප්‍රමාණයක නිරත වී නොසිටිය යුතු ය. එසේ වුවද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් ආවරණය වන පරිදි පිහිටුවා ඇති යම් ප්‍රජා පාදක සංවිධානයක බල ප්‍රදේශය මුළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයම වන අවස්ථාවක දී සහ එම කොට්ඨාශයේ විවිධ ක්ෂේත්‍රයන්හි කොන්ත්‍රාත් වැඩ ඉටුකිරීමට ප්‍රමාණවත් මූල්‍ය, ශ්‍රම සහ ව්‍යවසායක හැකියාවන් ඇති බවට

ප්‍රාදේශීය ලේකම්වරයා පෞද්ගලිකවම සෑහීමකට පත්වන අවස්ථාවක දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතිය ඇතිව යම් ප්‍රජා පාදක සංවිධානයකට කොන්ත්‍රාත් තුනකට වඩා වැඩි ප්‍රමාණයක් ලබා දිය හැකි ය.

2.5 පවරනු ලබන කොන්ත්‍රාත්තුව ප්‍රජා පාදක සංවිධානයේ/සමිතියේ බල ප්‍රදේශ සීමාවන් තුළ විය යුතු ය.

2.6 යම් කිසි ප්‍රජා පාදක සංවිධානයක් කොන්ත්‍රාත් ගිවිසුම කඩ කළ හොත් එවැනි සමිති/සංවිධාන අසාධු ලේඛන ගත කිරීම හා අසාධු ලේඛන යාවත්කාලීන කිරීම ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් කළ යුතු ය.

2.7 දෙපාර්තමේන්තු ප්‍රධානියා, අදාළ දිස්ත්‍රික් ලේකම්වරයා හෝ ප්‍රාදේශීය ලේකම්වරයා මෙම ප්‍රජා පාදක සංවිධාන විසින් කරනු ලබන කොන්ත්‍රාත් කටයුතු මනා ප්‍රමිතියකින් යුතුව සිදු කරන බවටත්, අදාළ තාක්ෂණික අධීක්ෂණය අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන සම්පූර්ණ කාලය තුළම සිදු කිරීමට අවශ්‍ය කටයුතු පිළියෙල කරන බවටත් වග බලා ගත යුතු ය.

2.8 ඉටු කරනු ලබන කාර්යය පිළිබඳ ප්‍රජා පාදක සංවිධානයේ නම, එම ව්‍යාපෘතියට රජය දැරූ වියදම, ප්‍රජා පාදක සංවිධානයට කොන්ත්‍රාත්තුව ලබා දුන් ආයතනයේ නම, ප්‍රතිලාභීන් ගණන ආදී විස්තර සහිත නාම පුවරුවක් ප්‍රදේශයේ ප්‍රජාවගේ දැන ගැනීම සඳහා සකස් කළ යුතු ය.

3. ප්‍රජා පාදක සංවිධානවලට රජයේ කොන්ත්‍රාත් පැවරීම සඳහා සුදුසුකම් තක්සේරු කිරීමේ නිර්ණායකයක් ලෙස එම සමිති "ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (Construction Industry Development Authority-CIDA)" ආයතනයේ ලියාපදිංචි වීම අවශ්‍ය නොවේ.

4. මෙයට අදාළව නිකුත් කර ඇති 2012.01.05 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2012 අවලංගු කරන අතර ඒ වෙනුවට මෙම චක්‍රලේඛය පමණක් අදාළ කර ගත යුතු ය.

5. මෙම චක්‍රලේඛය පිළිබඳ තවදුරටත් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 011-2484614 මඟින් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් ඇමතිය හැකි ය.

එස්.ආර් ආටිගල

භාණ්ඩාගාර ලේකම්

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති